26

# ඉස්ලාමීය නිවස

මෙලොව මවා ඇති සෑම ජීවරාශියකටම අල්ලාහ් වෙතින් ලබා දුන් දායාදවලින් ලස්සන නිවස ද එකකි. ආහාර ඇඳුම් සේ ම එකිනෙක ජීවීන් තමන්ගේ වාසස්ථාන ද සොයා ගැනීමේ උත්සාහයේ නිරත වන අයුරු අපි දකින්නෙමු. එසේ ම මනුෂ්‍යයාට අල්ලාහ් වෙතින් ලබා දී ඇති නොයෙකුත් භාග්‍යයන්ගෙන් එකක් සේ සාමකාමී නිවහන ද ඉස්ලාම් දක්වා ඇත.

## ඉස්ලාමීය නිවස සන්සුන් ස්ථානයකි.

ඉස්ලාම්, පවුල් ජීවිතයට ප්‍රමුඛත්වයක් ලබා දේ. එම පවුල නැමැති ඒකකය අලංකාර නිවසක් මගින් සෞඛ්‍ය සම්පන්න ව බිහිවන බව ඉස්ලාමීය මතය වේ. මෙය අල්ලාහ් තමන්ගේ ශුද්ධ වූ ග්‍රන්ථයෙන් අපට පෙන්වා දී ඇත.

අල්ලාහ් ඔබට ඔබගේ නිවහන සංසුන් ස්ථානයක් ලෙස පත්කර ඇත. (16:80)



## අල්ලාහ් ගේ සිතුවිල්ලෙන් ප්‍රබෝධවත් නිවහනක්

මුඃමින්වරයෙකුගේ නිවස දෙවියන් සිහි කිරීමේ නිවහනක් ලෙස තිබිය යුතු ය. එහි අල්- කුර්ආන් (දේව වැකි) පාරායනා කළ යුතුයි. ආගම ඉගැන්විය යුතු ය. "ඔබගේ නිවෙස්වල පාරායනා කරනු ලබන අල්ලාහ්ගේ වදන් ද, සැනසුම ද,මෙනෙහි කරන්න. ඥානවන්ත වදන් ද මතකයේ තබා ගනු. නියත වශයෙන් ම අල්ලාහ් තීක්ෂණ බුද්ධියකින් යුත්තෙකු හා සියල්ල හොඳින් දන්නෙකු වශයෙන් සිටින්නේ ය." අල්- කුර්ආන් (33:34) දෙවියන් සිහි කරන්නාවූ නිවසටත්, දෙවියන් සිහි නො කරන්නාවූ නිවසටත් නබිතුමා දක්වන්නාවූ උපමාව සලකා බලන්න. නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණෝ මෙසේ පැවසූහ.

අල්ලාහ් සිහි කර ප්‍රශංසා කරන්නාවූ නිවහනේ තත්ත්වය පණ ඇත්තෙකුගේ තත්ත්වයටත් අල්ලාහ් සිහි කර ප්‍රශංසා නොකළ කෙනෙකුගේ නිවහනේ තත්ත්වය පණ නැති කෙනෙකුගේ තත්ත්වයටත් සමානයැයි. ඔබගේ සමහර සලාතයන් ඔබගේ නිවහනේ ඉටු කරන්න. ඔබගේ නිවහන(කබ්ර්) මිනී වළක් බවට පත් නො කරන්න. (බුහාරි)

අප ජීවතුන් අතර සිටින විට අපගේ නිවහනේ දෙවියන් සිහි කිරීමක් නොකෙරුවේ නම් එහි ධර්ම දේශනා ඉගැන්වූයේ නැත්නම් අපගේ නිවහනත්



කබ්රයත් අතර වෙනසක් නැත. නමුත් එහි වෙනසකට ඇත්තේ කබ්රයේ මරණයට පත්වූ අය සිටින අතර නිවසේ මැරුණු හදවත් ඇති අය සිටීමයි.

"ඔබලගේ නිවසේ සූරා බකරාව පාරායනා කරන්න! කාගේ නිවසේ සූරා බකරාව පාරායනා කරනු ලැබුවේ ද එම නිවසට ෂෙයිතාන් ඇතුළු වෙන්නේ නැත." මෙලෙස නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණෝ පැවසූහ (තබරානි)

## නිවහන නිසසල බවේ අඩිතාලමකි.

"ඔබගේ නිවසේ ඔබට අල්ලාහ් සන්සුන් බව ඇති කළේ ය. ඔබලා ගමනක දී සිටිය දී ඔබලාට පහසුවෙන් රැගෙන යා හැකි කූඩාරම් සතුන්ගේ හම් වලින් ඔහුමයි ඔබලාට සකස් කර දී ඇත්තේ."(16:80) බැටළුවාගේ ලෝම, ඔටුවාගේ ලෝම හා සුදු එළුවාගේ ලෝම යනාදියෙන් භාණ්ඩ හා සැප පහසුකම් යම් කාල පරිච්ඡේදයක් තුළ සැප පහසුකම් (ලබා ගැනීමේ) හැකියාවක් ද ලබා දී ඇත. මේ වැකියේ නිවාස යනු මනුෂ්‍යයාට සැනසුම ආරක්ෂාව හා නිදහස ලබා දෙන්නා වූ ස්ථානයක් ලෙස පැහැදිලි ය.

"තම නිවසේ පුද්ගලයෙක් හිඳ එයින් ඔහුගේ ප්‍රශ්නවලින් ජනතාවත් ජනතාවගේ ප්‍රශ්නවලින් ඔහුත් ආරක්ෂාව ලබන්නේ ද, එවැනි මිනිසා අල්ලාහ්ගේ රැකවරණයේ සිටියි.

## ඉස්ලාමීය නිවස ආශ්‍රිත පරිසරයෙහි පිළිපැදිය යුතු දේවල්

නිවහන ආධ්‍යාපනික ස්ථානයක් ලෙස පවත්වා ගෙන යෑම අත්‍යවශ්‍ය වේ. නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණෝ තම බිරින්දෑවරුන්ට නිවසේ දී දහම් අධ්‍යාපනය ලබා දුන්හ. දරුවන්ට ඉස්ලාමීය සිරිත් විරිත් ඉගැන්වූහ. එනම් අපගේ නිවෙස්වලත් අධ්‍යාපනයට දිරිගැන්වීමක් කළ යුතු ය. අල්- කුර්ආන් පාරායනා කිරීම ඉස්ලාමිය පොත් කියවීම සංයුක්ත තැටි හා සඟරා යනාදිය තබා පරිහරණය කරීම වඩාත් යෝග්‍ය වේ.

### නිවසේ දී පිළිපැදිය යුතු කරුණු

1. නිවසට ඇතුළුවීමට පෙර සලාම් පවසන්න. පිළිතුර ලෙස සලාම් ලැබුණහොත් පමණක් ඇතුළට යා යුතුයි.

"විශ්වාසවන්තයිනි, නුඹලාගේ නිවස හැර අන් නිවෙස්වලට ඔවුන්ගේ අවසරය නුඹලාට ලැබෙන තුරු ද එහි වැසියන්ට නුඹලා සලාම් (සාමය)

පතන තුරු ද ඇතුළු නොවනු. මෙය නුඹලාට ඉතා හොඳ ය. නුඹලා (මෙය) මෙනෙහි කළ යුතුයි.” (24:27)

එහි නුඹලා කිසිවෙකු නො දුටුවේ නම් නුඹලාට අවසරය ලැබෙන තුරු ඊට ඇතුළු නොවෙනු. තව ද ආපසු යනුයි නුඹලාට කියනු ලැබුවේ නම් ආපසු යනු. එය නුඹලාට වඩාත් පිවිතුරු ය. නුඹලා කරන දෑ ගැන අල්ලාහ් සර්වඥ ය. (24:28)

නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණෝ කෙනෙකු ගේ නිවසට යන විට තුන්වරක් සලාම් පවසා අනුමැතිය ලබා ගනිති. පිළිතුරු ලැබුණහොත් ඇතුළට යති. නැත්නම් හැරී යති.

2. නිවසට ඇතුළුවන විට

بِسْمِ اللهِ وَلَجْنَا, وَبِسْمِ اللهِ خَرَجْنَا, وَعَلَى اللهِ رَبِّنَا تَوَكَّلْنَا

බිස්මිල්ලාහි වලජ්නා වබිස්මිල්ලාහි කරජ්නා වඅලල්ලාහි රබ්බනා තවක්කල්නා යයි පාරායනය කළ යුතු ය.

3. පවුලේ ඥාතීන් සමග සහෝදරත්වයෙන් කටයුතු කිරීම පරිත්‍යාග ශීලී, දනශීලී බව, ආගන්තුක සත්කාර, තැන්පත් ව කතා බහ කිරීම යන ගුණාංග අනුගමනය කිරීම.

4. බොරුව, ඊර්ෂ්‍යාව, කේලම්, යනාදී ඥාති සම්බන්ධතා බිඳවන නරක ගුණාංගවලින් වැළකී සිටිය යුතු ය.

5. සෑම විට ම නිවස හා අවට පරිසරය, පිරිසිදුව හා අලංකාරවත්ව තබා ගත යුතුයි.

6. නිවසේ පරිහරණය කරන ගෘහ භාණ්ඩ ක්‍රමානුකූල ව පිළිවෙළට හා පිරිසිදුව පවත්වා ගෙන යා යුතු යි.

## අභ්‍යාසය

අ) පහත ප්‍රකාශන හරි නම් √ ලකුණ ද වැරදි නම් × ලකුණ ද යොදන්න.

1. අල්ලාහ්ගේ දයාව නිසා පහසුකම් තිබෙන නිවහනක් ලැබිය හැකි ය. ( )
2. අල්ලාහ් සිහිකරන ස්ථානයක් ලෙස නිවසක් නොතිබිය යුතු ය. ( )
3. නිවසක් මිනීවළක් නොකරන්න යනුවෙන් නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණෝ පැවසූහ. ( )
4. නිවසකින් පවුල් ඒකකයට ශාන්තිය උදා වේ. ( )
5. සූරා බකරා පාරායනා කරන නිවසේ ෂෛයිතාන් හා සතුන් ඇතුළු වන්නේ නැත. ( )
6. නිවහන සෑම මැවීමකට ම ආරක්ෂාව සපයයි. ( )
7. නිවසට ආ අමුත්තන්ට ආපසු හැරී යන්න යනුවෙන් පැවසීම ද පුරුද්දක් කර ගත යුතුය. ( )
8. නිවස හා අවට පරිසරය පිරිසිදු ව තබා ගැනීම හොඳ පුරුද්දකි. ( )

ආ) නිවසක් අධ්‍යාපනය ලබන ස්ථානයක් ලෙස වෙනස් කර ගන්නේ කෙසේ ද?

ඇ) නිවස තුළ පිළිපැදිය යුතු සාරධර්ම 5ක් සඳහන් කරන්න.